**ශීර්ෂය 130 - රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 130 - රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) දේපළ, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2013 ජූලි 12 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව මූල්‍ය නොවන වත්කම් තක්සේරු කර ගිණුම්ගත කරනු වෙනුවට රු.100ක ආරෝපිත නාමික වටිනාකමක් මත අයිතම් 3,812ක් ද තවත් වත්කම් ඒකක 221ක් වටිනාකමක් රහිතවද ගිණුම්ගත කර තිබුණි. තවද 2020 – 2023 කාලපරිච්ඡේදය තුළදී කාර්යාල උපකරණ අබලි ද්‍රව්‍ය ඒකක 5,697ක් අපහරණය කර තිබුණද සිගාස් දත්ත පද්ධතියට අවශ්‍ය ගැළපීම් සිදුකර නොතිබුණි. | **Cigas** දත්ත පද්ධතියට ඇතුළත් කරන ලද නාමික අගය රු.100ක් සහිත අයිතම සහ නාමික අගයක් නොමැති අයිතම සැළකිය යුතු ප්‍රමාණයක පද්ධතියේ පවතින අතර එය 2017 වර්ෂයේ අගය නිවැරදිව තහවුරු කර ගැනීමට නොහැකිවීම හේතුවෙන් පද්ධතියට ඇතුළත් කරන ලද දත්ත වේ. නමුත් 2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයට සමගාමීව සිදුකරන ලද භාණ්ඩ තක්සේරුවේදී හඳුනාගන්නා ලද අයිතමයන් හා තක්සේරු කරන ලද වටිනාකම් **Cigas** දත්ත පද්ධතියට ඇතුළත් කිරීම මේ වන විට ආරම්භ කර ඇත. තව ද 2020-2023 කාලපරිච්ඡේදයට අදාළව අපහරණය කරන ලද අයිතමයන්ගේ වටිනාකම් ද මෙම ක්‍රියාවලිය තුළින් නිවැරදි වන අතර මූල්‍ය නොවන වත්කම් සම්බන්ධයෙන් **Cigas** දත්ත පද්ධතියම මේ තුළින් නිවැරදි වීමක් සිදුවේ. | මූල්‍ය නොවන වත්කම්වල නිවැරදි අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (ii) | අමාත්‍යාංශය යටතේ පවතින නිල නිවාස 42ක වටිනාකම රු.746,550,000ක් සංචාරක බංගලාවල ගොඩනැගිලි යටතේ ද, දියතලාව සංචාරක බංගලා දෙකෙහි වටිනාකම රු.14,601,000ක් බණ්ඩාරවෙල සංචාරක බංගලා ගොඩනැගිලි ගිණුම යටතේ ද ගිණුම්ගත කර තිබුණෙන් වර්ගීකරණයේ දෝෂයක් පැවතුණි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව හා එක්ව ජර්නල් සටහන් මඟින් මූල්‍ය නොවන වත්කම්වල වර්ගීකරණය නිවැරදි කරගන්නා බව කාරුණිකව දැනුම් දෙමි. | මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් නිවැරදිව වර්ගීකරණය කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 20.02.01.01 ආදායම් සංකේතාංකයට අයත් සම්පූර්ණ ගොඩනැගිලි මොනවාද යන්න හඳුනාගැනීම සඳහා දත්ත පද්ධතිය සකස් කිරීම 2021 වර්ෂයේදී ආරම්භ කර තිබුණ ද 2024 මැයි 30 දක්වා සියළු ගොඩනැගිලි දත්ත පද්ධතියට ඇතුළත් කිරීම අවසන් කර නොතිබුණි. | මේ වන විට ආදායම් ශීර්ෂාංක 20.02.01.01 යටතේ මෙම අමාත්‍යාංශයට අයත් ගොඩනැගිලි වර්ග කර හඳුනා ගතහැකි වන පරිදි දත්ත පද්ධතිය සකසා ඇත. අනෙකුත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අදාළ ගොඩනැගිලි සියල්ල දත්ත පද්ධතියට ඇතුළත් කිරීමට නියමිතය. | දත්ත පද්ධතිය කඩිනමින් සකස්කර අදාළ ආදායම් සංකේතාංකය යටතේ ගොඩනැගිලි කුලී, රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 4 (ආ) ඡේදය ප්‍රකාරව ආදායම් ගණන්දීමේ නිලධාරීන් විසින් හිඟ ආදායම් එකතු කර ගැනීමට කටයුතු කිරීම සහ අයවීමට ඇති හිඟ ආදායම් තව තවත් එකතුවීම වැළැක්වීම සඳහා ක්ෂණිකව පියවර ගතයුතු වුවත්, ආයතන 32 කින් 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ගොඩනැගිලි හිඟ කුලී ආදායම රු.332,724,629ක්වී තිබුණු අතර ඉන් රු.198,688,576ක් 2020 දෙසැම්බර් 31 දිනට පෙර වර්ෂවල සිට අයවිය යුතුව පැවැතුණි. මෙම හිඟ කුලී මුදලින් සියයට 18ක් හෙවත් රු.59,142,348ක් මෙම අමාත්‍යාංශය යටතේ පාලනය වන රජයේ බංගලා, සංචාරක බංගලා සහ නිල නිවාසවලින් අයවිය යුතුව පැවතුණි. | 2023.12.31 දිනට අයවීමට තිබූ හිඟ ආදායමෙන් 2024.03.31 දිනට රු.54,837,957.62 ක් අයකර ගෙන ඇත. සමාලෝචිත වර්ෂයේ දී හිඟ ආදායම් ඇතිවීමට හේතු ලෙස ලිපි ලැබීම් ප්‍රමාදවීම් සහ චෙක්පත් ලැබීම් ප්‍රමාදවීම් ප්‍රධාන වශයෙන් දැක්විය හැකිය. ලිපි මඟින් දැනුවත් කිරීම, අදාළ ආයතනවල සහභාගිත්වය මඟින් හිඟ ආදායම් අයකර ගැනීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම සහ දුරකතන මඟින් නිරන්තරයෙන් පසුවිපරම් කිරීම මඟින් අයවීමට ඇති හිඟ ආදායම අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | හිඟ නිවාස කුලී අයකර ගැනීමට හා හිඟකුලී තව තවත් එකතු වීම වැළැක්වීම සඳහා ක්ෂණිකව පියවර ගතයුතුය. |

| | | | |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඇමතිවරුන් සහ මන්ත්‍රීවරුන් 56 දෙනෙකුගෙන් රු.3,687,360ක හිඟ කුලී මුදලක් අයවිය යුතුව පැවතුන අතර එම ශේෂය තුළ 2015 වර්ෂයේ සිට පැවත එන රු.1,368,920ක් වූ ශේෂ 19ක්ද විය. | 2024.05.20 දින වනවිට ඇමතිවරුන් සහ මන්ත්‍රීවරුන්ගේ හිඟ නිවාස කුලී මුදල රු.3,593,870 කි. | නිරන්තරයෙන් පසුවිපරම් කටයුතු සිදුකර හිඟකුලී අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii) | සමුළු නිවාස 35කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති මුදලින් රු.2,292,702ක් තවදුරටත් අයවිය යුතුව පැවතුණ අතර එයින් රු.2,025,801 ක් 2012 සිට 2022 වර්ෂය දක්වා වූ වසර 10 ක කාලපරිච්ඡේදයට අදාළව තවදුරටත් අයනොවී පවතින හිඟ ශේෂ විය. තවද ජයවඩනගම නිවාසවල 2012 සිට 2021 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ පදිංචිව සිටි නිලධාරින් 18 දෙනෙකුගෙන් අයවිය යුතුව පැවති මුදලින් රු.8,790,490 ක් අයකර ගෙන නොතිබුණි. | 2024.05.20 දින වනවිට අයවිය යුතු හිඟ නිවාස කුලී මුදල වන්නේ රු.2,292,702.45කි. එයින් 2012 සිට 2022 වර්ෂය දක්වා පැවති හිඟ මුදලින් මේ වනවිට පවතින හිඟය වන්නේ රු.2,025,801.07 කි. ජයවඩනගම නිවාසවලින් 2024.05.20 දිනට අයවිය යුතුව පවතින හිඟ මුදල රු.8,790,490.46කි. | - එම - |
| (iii) | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත වෙන්කර දී තිබූ බංගලා නිවාසයකින් 2012 වර්ෂයේ සිට අයවිය යුතු රු.28,567,470ක ශේෂයක් හා නිදන්ගත වකුගඩු රෝග වැළැක්වීමේ පර්යේෂණ ලේකම් කාර්යාලයට ලබා දී තිබූ නිවාසයකින් | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත වෙන්කර දී තිබූ බංගලා නිවාස වලින් 2012 වර්ෂයේ සිට අයවිය යුතු රු.28,567,470.00 ක මුදල සම්බන්ධයෙන් මේ වන විට රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සමඟ සාකච්ඡා කරමින් පවතී. නිදන්ගත වකුගඩු රෝග වැළැක්වීමේ පර්යේෂණ ලේකම් කාර්යාලයට ලබා දී තිබූ | - එම - |

| | | | |
|---|---|---|---|
| | 2015 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාළව අයවිය යුතුව පැවති මුදලින් රු.4,798,387ක ශේෂයක් නිරවුල් කර නොතිබුණි. | නිවාසයෙන් ඉතිරි හිඟ මුදල මේ වසරේ අයකර ගැනීමට කටයුතු කරමින් පවති. | |

## 2.2 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූලධන වැය විෂයන් 16ක් සඳහා සලසාගෙන තිබුණු රු.112,450,000ක් වූ සමස්ත ඇස්තමේන්තු ප්‍රතිපාදනයම සහ පුනරාවර්තන වැය විෂයන් 08ක් සඳහා සලසාගෙන තිබුණු රු.9,320,000ක සමස්ත ඇස්තමේන්තු ප්‍රතිපාදනයම ඉතිරිව තිබුණි. | **N-Leep** ව්‍යාපෘතිය අවසන් වීම හා වසා දමන ලද බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමේන්තුව සතු සම්පත් භාවිතයට ගැනීම, අක්මුදල් නිදහස් නොකිරීම, ආර්ථික වශයෙන් ඵලදායි නොවීම හේතුවෙන් යන්ත්‍ර අළුත්වැඩියාවන් සිදු නොකිරීම, ජාතික අයවැය චක්‍ර ලේඛ 03/2022 අනුව සියළු සංවර්ධන කටයුතු අත්හිටුවීම, පුහුණු වැඩමුළු **Zoom** තාක්ෂණය මඟින් සිදුකිරීම, සැලැසුම් කළ පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම මත මූලධන ප්‍රතිපාදන ඉතිරි විය.<br><br>විදේශ ගමන් අවස්ථා නොලැබීම, අළුත්වැඩියාවන් සිදුනොවීම, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කටයුතු සඳහා වැය දැරීමට සිදුනොවීම, පොදු රාජ්‍ය මණ්ඩලයේ පළාත් පාලන සංසදයේ සාමාජික මුදල් නොගෙවීම මත පුනරාවර්තන ප්‍රතිපාදන ඉතිරි විය. | මුදල් රෙගුලාසි 50(ii) ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. |
| (ආ) | මූලධන වැය විෂයන් 17ක් සඳහා සලසාගෙන තිබුණු එකතුව රු.692,950,000ක් වූ ප්‍රතිපාදනවලින් සියයට 80කට වැඩියෙන් එනම් රු.553,273,789ක් ඉතිරිව තිබුණු අතර එම එක් එක් වැය විෂයන්ගේ ඉතිරිවීම් ප්‍රතිශතය සියයට 50ත් සියයට 94ත් අතර පරාසයක පැවැතුණි. | 03/2022, 01/2023, 02/2023 දරන අයවැය චක්‍ර ලේඛ පරිදි කටයුතු කිරීම, අළුත්වැඩියා වියදම් පාලනය හා N-Leep ව්‍යාපෘතිය අවසන් වීම හා වසා දමන ලද බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමේන්තුව සතු සම්පත් උපයෝගී කර ගැනීම මත ප්‍රතිපාදන ඉතිරි විය. | - එම - |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පුනරාවර්තන වැය විෂයන් 09ක් සඳහා මුදල් රෙගුලාසි 66 යටතේ මාරුකර තිබූ එකතුව රු.116,265,000ක ප්‍රතිපාදනවලින් සියයට 25ත් සියයට 100ත් අතර පරාසයක වන පරිදි රු.45,665,861ක් ද, මූලධන වැය විෂයන් 03ක් සඳහා මාරුකර තිබූ එකතුව රු.4,539,000ක ප්‍රතිපාදනවලින් සියයට 35ත් සියයට 79ත් අතර පරාසයක වන පරිදි රු.2,265,722ක් ද උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි. | වැය විෂයන්හි ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත අතිරේක ප්‍රතිපාදන සලසාගත් බව හා අතිරේක ප්‍රතිපාදන සලසාගනු ලැබුවද එම වියදම් වෙනත් වැය විෂයන් යටතේ දැරීම හේතුවෙන් ප්‍රතිපාදන මාරුගත් වැය විෂයන්හි ප්‍රතිපාදන ඉතිරි විය. | සැලසුම් සහගතව ප්‍රතිපාදන මාරු කිරීම හා ඒවා වැය කිරීම කළ යුතුය. |

**2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය පරිපාලන අංශයේ මූලධන වැය විෂයක් ඇතුළුව වැය විෂයන් 10කට අදාළව බැරකම් ප්‍රකාශයේ දක්වා තිබූ බැරකම් ප්‍රමාණය රු.206,179ක් වුවද එකී බැරකම්වලට අදාළ 2024 ජනවාරි 01 සිට මාර්තු 31 දක්වා ගෙවීම් වවුචර්වල වියදම රු.1,018,145ක් විය. එසේම ස්වදේශ කටයුතු අංශයේ 2024 ජනවාරි - මාර්තු ගෙවා තිබුණු රු.297,826 ක බැරකම්, බැරකම් ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | මින් ඉදිරියට එවැනි අතපසුවීම් ඇති නොවන ලෙස කටයුතු කිරීමට අදාළ නිලධාරීන් හට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. | බැරකම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට හා භාණ්ඩාගාරය වෙත වාර්තා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2020, 2021, 2022 සහ 2023 වර්ෂවලට අදාළව "පිබිදෙමු පොළොන්නරුව වැඩසටහන" වෙනුවෙන් පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ලබාදුන් බැරකම් හා ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත අමාත්‍යාංශය විසින් ලබාදුන් තොරතුරු සමඟ සැසඳීමේදී ආරම්භක ශේෂයන්හි | 2023 වර්ෂයේ අමාත්‍යාංශයේ බැරකම් ලේඛනයේ ඇතුළත් කර නොමැත. පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් තොරතුරු විමසා ඇත. පිළිතුරු ලද වහාම ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | බැරකම් නිවැරදිව ගිණුම්ගත කිරීමට හා භාණ්ඩාගාර තොරතුරු සමඟ සැසඳීමට කටයුතු කළ යුතුය. |

පිළිවෙලින් රු.1,797,528,618ක්, රු.52,102,401ක්, (රු.533,242,982)ක් හා (රු.13,541,087,251)ක් වශයෙන් වෙනස්කම් පැවතිණි. එම ශේෂයන් හි වෙනස්කම් සඳහා හේතු අනාවරණය කරගෙන නිවැරදි කර නොතිබුණි.

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 1.1 හා 1.2 වගන්ති | තනතුරු සඳහා නිවාස ඉදිකර, උපලේඛනගත කළ හැකි අතර 2003 ඔක්තෝබර් 17 දිනැති අංක 11/2003 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් මෙම අමාත්‍යාංශය සතුව උපලේඛනගත නිවාස නොමැති බවට දක්වා තිබුණි. එසේ වුවද ආයතන සංග්‍රහයට හා මෙම චක්‍රලේඛයට පටහැනිව අමාත්‍යවරයාගේ අනුමැතියෙන් පොදු නිවාස 06ක් හා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියෙන් පොදු නිවාස 16ක් උපලේඛනගත කර ලබාදී තිබුණි. | සේවා අවශ්‍යතාවය සහ සුවිශේෂී වූ හේතු සළකා බලා ආයතන සංග්‍රහයෙහි විධිවිධානවලට අනුකූලව අදාළ තනතුරු සඳහා මෙම අමාත්‍යාංශයට අයත් නිල නිවාස ආයතන සංග්‍රහයේ XIX වන පරිච්ඡේදයේ 2.2 වගන්තිය ප්‍රකාරව උපලේඛනගත කර ලබා දී ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කළ යුතු අතර අමාත්‍යාංශයේ නිවාස වෙන් කිරීම සඳහා උපලේඛනගත තනතුරු ඇති කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මුදල් රෙගුලාසි 104 | • අලාභහානිය සිදු වූ දිනයේ සිට තුන් මසක් ඇතුළත දී පූර්ණ වාර්තාව ඉදිරිපත් කළ යුතු වුවත් රාජ්‍ය පරිපාලන අංශයේ වාහන අනතුරු 02ක් සම්බන්ධයෙන් එම වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | අනතුරු මඟින් සිදු වූ අලාභහානි අලුත්වැඩියා කිරීම සඳහා ගතවන කාලය වැඩි වීම, වාහන අනතුරු සඳහා නඩු පවරා තිබීම හා පොලිස් වාර්තාව ප්‍රමාද වීම වැනි හේතු මත ඇතැම් වාහන සඳහා පූර්ණ වාර්තාව මාස 03ක් ඇතුළත ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | | • දිගින් දිගටම අමාත්‍ය කාර්යාලයේ භාණ්ඩ සමීක්ෂණයේදී ඌනතා ලෙස හඳුනාගෙන තිබුණු වත්කම් අයිතම් ඒකක 257ක් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී කමිටුවක් පත්කර ඒ අනුව සිදුකළ යුතු නිවැරදි කිරීම් සිදු කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව. | - එම - |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | මාස 06කට වරක් වාහනවල ඉන්ධන දහන පරීක්ෂාව සිදුකළ වුවත් අමාත්‍යාංශය සතු වාහන 88 ක එම පරීක්ෂාව එසේ සිදු කර නොතිබුණි. | 2023 වසරේ ඉන්ධන පරීක්ෂාවන් සිදුකිරීමට නොහැකි වූ නමුත් 2024 වර්ෂය සඳහා ඉන්ධන පරීක්ෂණ සිදු කරනු ලබයි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2022 සැප්තැම්බර් 09 දිනැති අංක 10/22 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | රාජ්‍ය පරිපාලන අංශයේ වසරකට අධික කාලයක් භාවිතයෙන් ඉවත් කර තිබුණු මෝටර් රථයක් අපහරණය කර නොතිබුණි. | පළාත් සභා හා පළාත් පාලන අංශය හරහා වාහන අවශ්‍ය වෙනත් පළාත් පාලන ආයතනයක් වෙත මෙම රථය ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සීමා නිර්ණය සඳහා පළමු අමාත්‍ය මණ්ඩල තීරණය ලබාදී වසර දෙකක් හා දෙවන අමාත්‍ය මණ්ඩල තීරණය ලබාදී වසරක් ගතවී තිබුණි. 2021 සහ 2022 වර්ෂවල ඒ වෙනුවෙන් රු.7,760,180 ක් වැය කර තිබුණද සම්බන්ධීකරණ කමිටු අනුමැතිය සහිත සවිස්තරාත්මක අවසන් වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙත 2024 මැයි 30 දිනවන විටත් ඉදිරිපත් කර නොතිබුණි. | 2021.05.21 දින වන විට දිස්ත්‍රික්ක 16ක සම්බන්ධීකරණ කමිටු නිර්දේශයන් ලබා දී ඇති අතර අනෙකුත් දිස්ත්‍රික්ක වෙතින් කමිටු නිර්දේශ ලැබී නොමැත. නමුත් 2023 වර්ෂයේ රටෙහි උද්ගත වූ දේශපාලන අරගලකාරී පසුබිමක දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු පැවැත්වීම සම්බන්ධයෙන් යම් ගැටළුකාරී තතත්වයක් පැවති බවත් එම හේතුවෙන් සම්බන්ධීකරණ කමිටුවල කටයුතු ප්‍රමාද වී ඇති බවත් දිස්ත්රික් ලේකම්වරු වෙතින් එම වාර්තා ලද පසුව සියලුම දිස්ත්‍රික්කයන්ගේ සම්බන්ධීකරණ කමිටු නිර්දේශ සහිතව සීමා නිර්ණ කමිටුව විසින් ලබා දී ඇති අවසන් වාර්තාව ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය ප්‍රකාරව අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මඟින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සිදු කරනු ලැබේ. | සීමා නිර්ණය කිරීමේ කමිටු වාර්තාව කඩිනමින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර අපේක්ෂිත අරමුණු ඉටුකර ගතයුතුය. |
| (ආ) | 2021 සැප්තැම්බර් 14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සීමානිර්ණ කමිටු සාමාජිකයින් සඳහා ගෙවීමක් කිරීම සුදුසු බව දක්වා තිබුණු අතර සහාය කාර්ය මණ්ඩල සඳහා ගෙවීම් කිරීම රාජ්‍ය ආයතනවල වගකීමක් බව දක්වා තිබුණි. එසේ වුවද කමිටු රැස්වීම් වාර වියදම් තුළ සහය කාර්ය මණ්ඩලය සඳහා රු.914,500 ක් ගෙවා තිබුණි. | එම අමාත්‍ය මණ්ඩල තීරණයෙහි 5(iv) ආ (ii) ට අනුව ඇස්තමේන්තු ගත වියදම් හැකිතාක් අවම කරන ලෙසට ලබාදී ඇති අනුමැතිය අනුව, අවම සහාය කාර්ය මණ්ඩලයක් සඳහා ගෙවීම් සිදුකිරීමටද කටයුතු කර ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කටයුතු කළ යුතුය. |

## 3.2 විදේශ ආධාර ව්‍යාපෘති

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | යාපනයේ ඉන්කියුබේටර් (Incubator) සඳහා ව්‍යාපාරික මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක කිරීමට මූලධන වැය විෂයයක් යටතේ විදේශ ප්‍රදාන මඟින් රු.250,000,000ක් ද, විදේශ මූල්‍යාකරණ වැය විෂයය යටතේ රු.50,000,000ක් ද වශයෙන් එකතුව රු.300,000,000ක් වූ ප්‍රතිපාදන සලසාගෙන තිබුණද, සමාලෝචිත වර්ෂයේදී රු.490,955ක් පමණක් වැය කර තිබුණි. ඉකුත් වර්ෂයේදීද මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම සඳහා සලසාගෙන තිබුණු රු.240,000,000ක් වූ සමස්ථ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ඉන්දීය රජය හා ශ්‍රී ලංකා රජය අතර වසර 03කට පෙර එළඹ තිබූ අවබෝධතා ගිවිසුම 2022 පෙබරවාරි 21 දිනෙන් අවසන්ව තිබුණ ද ව්‍යාපෘතිය නිම කර නොතිබුණි. | උපදේශන කාර්යයන් වෙනුවෙන් ප්‍රසම්පාදිත සමාගමේ නිමැවුම් (Deliverables) භාර දී ඇතත්, එම සමාගම වෙනුවෙන් මේ වන තෙක් ගෙවා ඇත්තේ රු. 429,000 ක් පමණකි. ඉතිරි රු. මිලියන 8.15 මුදල ගෙවීම සම්බන්ධයෙන් නිර්දේශ වෙනුවෙන් පත් කළ සමාලෝචන කමිටුව මෙතෙක් නිශ්චිත නිර්දේශ ඉදිරිපත් කර නොමැත.<br><br>ව්‍යාපෘතියේ දෙවනි කාර්යය වන යෝජිත මධ්‍යස්ථානය සඳහා ගොඩනැගිලි ප්‍රතිස්ථාපනය වෙනුවෙන් ගොඩනැගිලි තෝරා ගැනීමේ දී යාපනය නගරයේ පවතින ගොඩනැගිලි හිඟය දැඩි බලපෑමක් ඇති කරන ලදී.<br>ශ්‍රී ලංකා රජය විසින් සුදුසු ගොඩනැගිල්ලක් සොයා ගැනීම හා අනෙකුත් අවශ්‍යතා සම්පූර්ණ කිරීම මත අළුත් ද්විපාර්ශ්වික අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම තීරණය වන බව දන්වා ඇත. | විදේශ හා දේශීය අරමුදල් මගින් සලසාගත් ප්‍රතිපාදන සැලැසුම් සහගතව ප්‍රශස්ථ මට්ටමින් උපයෝජනය කිරීමට ක්‍රියාමාර්ග ගතයුතු ය. |
| (ආ) | මහ කොළඹ ජලය සහ අපජලය කළමනාකරණ වැඩිදියුණු කිරීමේ වැඩසටහන අදියර 03 ක්‍රියාත්මක කිරීම සඳහා මූලධන වැය විෂයය යටතේ යුරෝපීය ආයෝජන බැංකු (යු.ආ.බැ.) ණය මගින් රු.947,034,807ක් හා විදේශ මූල්‍යාකරණ වැය විෂයය යටතේ රු.380,000,000ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණද ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී ප්‍රසම්පාදන කටයුතු අවසන් කර කොන්ත්‍රාත් පිරිනැමීම | 2023 වර්ෂය තුළ සිදු කරමින් පැවති ප්‍රසම්පාදන කටයුතු මේ වනවිට සිදු කර එක් කොන්ත්‍රාත්තුවක් පිරිනැමීම සිදු කර ඇති අතර ඒ සඳහා වූ උපදේශන සේවා බඳවා ගැනීම සිදු වෙමින් පවති. ඉතිරි කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා කැබිනට් අනුමැතියට කටයුතු සිදු කරමින් පවති. | -එම- |

| | | | |
|---|---|---|---|
| | ප්‍රමාද වීම හේතුවෙන් සලසාගෙන තිබුණු මුළු ප්‍රතිපාදනයම ඉතිරිව තිබුණි. | | |
| (ඇ) | ග්‍රාමීය පාලම් ඉදිකිරීම් ව්‍යාපෘතියෙහි යටිතල පහසුකම් සංවර්ධනය සඳහා එක්සත් රාජධානියේ ණය යටතේ සලසාගෙන තිබුණු රු.200,000,000ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන් ඉතිරිව තිබුණි. කොන්ත්‍රාත්තුවේ පැවැති ගැටළු හේතුවෙන් කොන්ත්‍රාත්කරු වෙත රඳවුම් මුදල් නිදහස් නොකිරීම ඉතිරිවීමට හේතු වී තිබුණි. | කොන්ත්‍රාත්කරු තුන්වන පාර්ශවයක් සමග ගිවිසුම් ගත වී ඇති බැවින් රඳවුම් මුදල් නිදහස් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගත යුතු වේ. | -එම- |
| (ඈ) | අපද්‍රව්‍යවලට වටිනාකමක් එකතු කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ජර්මානු රජයේ ප්‍රදාන යටතේ රු.260,000,000ක්ද, විදේශ මූල්‍යකරණ වැය විෂයය යටතේ රු.15,000,000ක්ද වශයෙන් සලසාගෙන තිබූ රු.275,000,000ක් වූ සමස්ථ ප්‍රතිපාදනයම ඉතිරිව තිබුණ අතර අදාළ ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත් ආයතන තෝරාගැනීමේ ක්‍රියාවලිය හෝ අවසන් කර නොතිබුණි. | කසල ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථාන 04ක් ඉදිකිරීම සඳහා අදාල සැලසුම් සහ ඇස්තමේන්තු සකසා අවසන් කර ඇත. එසේම අදාල ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත් ආයතන තෝරා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.<br><br>මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා 2023 වර්ෂය සඳහා වෙන්කර තිබූ මුදල් ප්‍රතිපාදන ව්‍යාපෘතියේ දේශීය බදු මුදල් නිරාකරණය කිරීම සඳහා බිල්පත් ඉදිරිපත් නොවීම මත ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | -එම- |

**3.3 දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **ඉ-ග්‍රාම නිලධාරී ව්‍යාපෘතිය** | | |
| | (i) ඉ-ග්‍රාම නිලධාරී ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේ සලසාගෙන තිබූ රු.1,500,000,000ක ප්‍රතිපාදනයෙන් රු.1,462,605,112ක් ඉතිරිව පැවතුන අතර සැලැසුම් කළ පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක | වැඩිම මුදල් ප්‍රමාණයක් වන රු.මිලියන1,028.5ක් වෙන් කර ඇත්තේ 2 in 1 වර්ගයේ ටැබ් පරිගණක ලබා ගැනීම සඳහාය. ඒ සම්බන්ධයෙන් 2022 වසර අවසන් වන විටත් විවෘතව තිබූ ප්‍රදානිත ප්‍රසම්පාදනය විධිමත්ව අහෝසි | සලසාගත් ප්‍රතිපාදන සැළසුම් සහගතව අදාළ කාර්යය සඳහා උපයෝජනය කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | නොකිරීම හේතුවෙන් 2017 වර්ෂයේ සිටම දිගින් දිගට ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. | කර විකල්ප වෙත යොමු වන ලෙස නිර්දේශිත අමා. මණ්ඩල සංදේශයේ පසු විපරම් කටයුතු 2023 වසර තුළ සම්පූර්ණ කිරීමට නොහැකි වීම නිසා ප්‍රතිපාදන උපයෝජනය නොවී ය. | |
| (ii) | ව්‍යාපෘතියට අදාළව ප්‍රචාරණ හා සන්නිවේදන අවශ්‍යතා සපුරා ගැනීමේ කාර්යය වැට් රහිතව රු.25,762,474කට ප්‍රචාරක ආයතනයකට අදාළ කාර්යය පවරා තිබුණද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 වගන්තිය ප්‍රකාරව විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි. | 2008/12/18 දිනැති අංක 08/2253/338/043 හා 2010.08.04 දිනැති 10/1682/407/014 දරන කැබිනට් තීරණ 02 අනුව සියළුම රාජ්‍ය ආයතන ඔවුන්ගේ සියළුම ප්‍රචාරණ කටයුතු ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව සැලසිනෙ ආයතනය මඟින් ඉටුකර ගත යුතු බවට තීරණය කර ඇති බැවින් ඊ-ග්‍රාම නිලධාරී ව්‍යාපෘතියට අනුව සන්නිවේදනය හා ප්‍රචාරණ අවශ්‍යතා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති සැලසිනේ ආයතනයට ලබාදී එපරිදි කටයුතු කිරීමට පියවර ගෙන ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුමගනය කළ යුතුය. |
| (iii) | තවද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 (1) වගන්තිය ප්‍රකාරව පිළිගත හැකි අත්තිකාරම් ගෙවීමේ සුරක්ෂිතයක් මත කොන්ත්‍රාත් මුදලින් සියයට 20ක උපරිමයක් දක්වා අත්තිකාරම් ගෙවිය හැකි වුවත්, ගෙවීමේ සුරක්ෂිතතාවයක් ඉදිරිපත් නොකර තිබියදීත් ගිවිසුම් මුදලින් සියයට 50 ක් වැනි ඉහළ වටිනාකමක් අත්තිකාරම් ලෙස රු.13,911,736ක් වැට් සහිතව එම ආයතනයට ගෙවා තිබුණි. | සැලසිනේ ආයතනයට ලබාදී ඇති 50%ක අත්තිකාරම් මුදලට සමානුපාතික කාර්ය ප්‍රමාණයකට අදාල නිමවුම් මඟින්, මෙම අත්තිකාරම පියවා ගැනීමට කටයුතු කරමින් පවතින බව සඳහන් කරමි. | - එම - |

| | | | |
|---|---|---|---|
| (ආ) | ගාල්ල දිස්ත්‍රික්කයේ ආසන 2000ක ශ්‍රවනාගාරයක් ඉදිකිරීම. | | |
| (i) | මෙම ව්‍යාපෘතිය සඳහා 2019 – 2020 කාලපරිච්ඡේදය තුළ රු.2,700,000,000 ප්‍රතිපාදන ලබා දී තිබුණ අතර 2023 ජුනි 14 දින වන විට රු.718,599,241 ක් වැයකර ඉදිකිරීම් කටයුතු අතහැර දමා තිබුණි. | දේශපාලන අධිකාරියේ සිදු වූ වෙනස මත මේ සම්බන්ධව අපේක්ෂිත මැදිහත් වීම් සිදු නොවීම හේතුවෙන් රටෙහි පවතින මූල්‍ය අර්බුදය යහපත්වන තුරු මෙහි ඉදිකිරීම් කටයුතු තාවකාලිකව නතර කිරීමට සිදුව ඇත. | දරන ලද වියදම නිෂ්කාර්ය වීමට ඉඩ නොහැර ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ශ්‍රවණාගාරය ඉදිකිරීමේ අරමුණ ඉටුකර ගත යුතුය. |
| (ii) | අදාළ ශ්‍රවණාගාරය ඉදිකිරීම සම්බන්ධව 2022 පෙබරවාරි 15 දින කල් ඉකුත්වී තිබුණු රු.132,843,884 ක් වූ කාර්යසාධන බැඳුම්කරය දින දීර්ඝ කර ගැනීමට හෝ මුදල් කරගැනීමට කටයුතු කර නොතිබුණ අතර ආපසු අයකර නොගත් අත්තිකාරම් මුදල රු.475,358,225ක් විය. | 2024 අයවැය යෝජනාව මඟින් මෙහි ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරිම සඳහා රු.මිලි. 500ක ප්‍රතිපාදන වෙන් කර දී ඇත. ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරිම සඳහා අවශ්‍ය ඉතිරි ප්‍රතිපාදන වෙන් කර ගැනීමට අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් සකස් කර ඇත. | කාර්යසාධන බැඳුම්කරයේ හා අත්තිකාරම් බැඳුම්කරයේ දින දීර්ඝ කරගත යුතුය. |

**3.4 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය පරිපාලන අංශයේ සහ ස්වදේශ කටයුතු අංශය යටතේ පවතින සංචාරක බංගලා 46කට අයත් ඉඩම් පවරා ගැනීම සිදු කර නොතිබුණි. | ඉඩම් පවරා ගැනීමේ කටයුතු මේ වන විට සිදුකරමින් පවතී. | වත්කම්වල අයිතිය හා පැවැත්ම තහවුරු කරගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පළාත් සභා සහ පළාත් අංශය යටතේ ලියාපදිංචි කර තිබූ එහෙත් වාහන ලැයිස්තුවට ඇතුළත්ව නොතිබූ හා භෞතිකව නොපවතින වාහන 04ක් කවර ආයතනයක් භාරයේ පවතීද යන්න නිශ්චය කර ගැනීමට නොහැකි වී තිබුණි. එසේම තංගල්ල ප්‍රාදේශීය සභාව පරිහරණය කරන කැබ් රථය එම සභාව වෙත විධිමත්ව පවරා දීමට හෝ නැවත ගෙන්වා ගැනීමට වසර 05ක පමණ කාලයක් පුරා කටයුතු කර නොතිබුණි. | වාහන හතර සම්බන්ධයෙන් වර්තමාන අයිතිකරු පිළිබඳ විමසීමක් මෝටර් රථ කොමසාරිස් වෙතින් සිදුකර ඇත. ඒ අනුව එම වාහන සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කරන බව කාරුණිකව දන්වමි. 252 - 6507 අංක දරන වාහනය තංගල්ල ප්‍රාදේශීය සභාව වෙත පැවරීම සම්බන්ධයෙන් විරෝධයක් නොමැති බවට මෝටර් රථ කොමසාරිස් වෙත දන්වා යවා ඇත. | - එම - |

## 3.5 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 14 දිනැති අංක 2310/29 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ කාර්ය පටිපාටික රීතිවල XVIII පරිච්ඡේදයේ 247 ඡේදයේ සඳහන් අරමුණු ඉටුවන ආකාරයෙන් ඒකාබද්ධ හා දීපව්‍යාප්ත සේවාවල නිලධාරීන්ගේ ස්ථානමාරු ක්‍රියාත්මක කර නොතිබුණ අතර අනිවාර්ය ස්ථාන මාරුවීම්වලට යටත් නිලධාරීන් සඳහා ස්ථානමාරු ප්‍රතිපත්තිය විධිමත්ව ක්‍රියාත්මක කර නොතිබුණු බවට නිරීක්ෂණය විය. | | |
| (i) | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ අයදුම්පත් යොමුකර තිබූ නිලධාරීන් 278කින් නිලධාරීන් 78ක්, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ අයදුම්පත් යොමුකර තිබූ නිලධාරීන් 281කින් නිලධාරීන් 92ක් හා ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ අයදුම්පත් ඉදිරිපත් කළ නිලධාරීන් 43 දෙනෙකුගෙන් 27ක් පමණක් ස්ථාන මාරු කර තිබුණි. | ආයතනයන්ගේ සේවා අවශ්‍යතාවයන්ද සලකා ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කරන ලද අයදුම්පත් අතරින් කිසිදු පාර්ශවයකට අගතියක් නොවන සේ ගැලපිය හැකි වූ ස්ථානමාරු චක්‍රව සිදු කරන ලදී. කෙසේ වෙතත් මුදල්, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික ස්ථායිතා අමාත්‍යාංශය, ජනාධිපති කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, අමාත්‍ය මණ්ඩල කාර්යාලය, කොමිෂන් සභා, පළාත් සභාවන්හි නිලධාරීන් අදාළ ආයතනයන්ගේ විශේෂ අනුමැතියකින් තොරව ස්ථානමාරු කිරීමේ හැකියාවක් නොමැත. | කාර්යපටිපාටික රීතිවල සඳහන් අරමුණු ඉටුකර ගැනීමට හැකිවන පරිදි හා දීර්ඝ කාලයක් එකම රාජකාරී ස්ථානයක රැඳී සිටීමට ඇති ඉඩකඩ අහුරමින් ස්ථානමාරු චක්‍රය ක්‍රියාත්මක කළ යුතුය. |
| (ii) | තවද, 2022 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ සේවයට අයත් සේවා 07ක නිලධාරීන් 133,963කින් ස්ථාන මාරුවීම්වලට යටත් වන එකම සේවා ස්ථානයක වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරීන් 14,323කගෙන් 2023 වර්ෂයේ ස්ථානමාරු සඳහා | ස්ථාන මාරු ලබා දීමේදී භූගෝලීය පිහිටීම, අනුමත මූල්‍ය ප්‍රතිලාභ, වෙනත් ප්‍රතිලාභ හා වරප්‍රසාද, සුදුසුකම් සපිරීම සඳහා වන අවම සේවා කාලය, කිසියම් සේවා ස්ථානයක සේවය කිරීම පිණිස ලබා දෙන උපරිම සේවා කාලය, නිලධාරියාට ඇති | - එම - |

| | | | |
|---|---|---|---|
| | අයදුම්පත් ලැබී තිබුණ ද ස්ථාන මාරු 3,916ක් සඳහා පමණක් ස්ථානමාරු නියෝග ලබාදී තිබුණි. | දුෂ්කරතා මෙන්ම වංචා හා දූෂණ සම්බන්ධ නිලධාරීන් සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග, ආයතනයන්හි පිහිටීම් වෙනස් කිරීම් මත නිලධාරීන් අගතියට පත්වීම්, සේවා අවශ්‍යතා සඳහා සුදුසු නිලධරයන් තෝරා ගැනීම් ආදී කරුණු ගණනාවක් සලකා බලනු ලබයි.<br><br>මෙම කරුණු මත යම් සේවා ස්ථානයක වසර 05 ඉක්මවා සේවය කල පමණින්ම කිසියම් නිලධරයෙකු ස්ථාන මාරු කල නොහැකි අතර, ඇතැම් ආයතන ප්‍රධානීන් විසින් සේවා අවශ්‍යතාවය මත සිදු කර ඇති රඳවා තැබීම් හා ඒ හා ආනුශාංගික කරුණු සළකා, කළ රඳවා ගැනීම් සළකා ඇති බවද දන්වා සිටිමි. | |
| (ආ) | දිස්ත්‍රික් ලේකම්වරු පත් කිරීමේදී සළකා බලනු ලබන නිර්ණායක සම්බන්ධයෙන් 2022 නොවැම්බර් 29 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී දිසාපති තනතුරු සඳහා තෝරා ගැනීමේ නිර්ණායක නැවත සකස් කර ඉදිරිපත් කිරීමට කමිටුවක් පත් කළ යුතු බවට වූ තීරණය අනුව 2022 දෙසැම්බර් 02 දින නිලධාරින් තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත් කර තිබුණද නව නිර්ණායක සකස් කර අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර නොතිබුණි. | දිස්ත්‍රික් ලේකම්වරුන් පත් කිරීමේදී සළකා බලනු ලබන නිර්ණායක සකස් කිරීම සඳහා 2022.12.02 දිනැතිව නිලධාරීන් 03 දෙනෙකුගෙන් යුතු කමිටුවක් පත් කර ඇති අතර , එම කමිටුව මඟින් සකස් කරන ලද නව නිර්ණායක අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීමට පෙර 2022.12.27 දින සම්මුඛ පරීක්ෂණය අවලංගු කර ඇති බැවින් නිර්ණායක ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇති බව දන්වමි. | දිසාපතිවරුන් පත්කිරීමේ නව නිර්නායක කඩිනමින් සකස් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | වර්ෂ 05ක් ඉක්ම වූ ස්ථානමාරු වී ගිය නිලධාරින්ගෙන් රු.526,658ක් ද සේවය හැරගිය නිලධාරින්ගෙන් රු.702,464 ක් ද ණය ශේෂ අයවිය යුතුව පැවතුණි. | මෙම ණය ශේෂ කඩිනමින් නිරවුල් කිරිමට කටයුතු කරන බව. | ණය ශේෂ කඩනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |